# උරුම ආරක්ෂණ ක්‍රියාවලියේ දී භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම හා කාර්යභාරය පිළිබඳ විමැසුමක්

කැලේගම ජිනරතන හිමි

## හැඳින්වීම

ලොව මෙතෙක් පැවති හා පවත්නා ඕනෑම ජන කණ්ඩායමක වේවා, සමාජයක වේවා, ඔවුන්ගේ සංස්කෘතික බව හා සභ්‍යත්වය සම්බන්ධ සමාජමය තත්ත්ව අවබෝධ කරගැනීම සඳහා ඒවායෙහි සමාරම්භක අවස්ථාව හා පරිණාමීය ක්‍රියාවලිය පිළිබඳව යම් වැටහීමක් පැවතිය යුතුය. එම සමාජයන්හි පවත්නා හා පැවති පෙර කී තත්ත්ව ප්‍රකට කරන කදිම සාධක වන්නේ එම සමාජයන්හි විසූ පුද්ගලයින් විසින් තම විවිධ අවශ්‍යතා පූරණය කරගැනීම් වස් නිපදවා පරිහරණයකොට වර්තමානයට දායාද කරන ලද ද්‍රව්‍යාත්මක දේ බව වටහා ගැනීම ද මෙහි දී අත්‍යවශ්‍යය. එනයින් බැලීමේ දී අතීතයේ පැවති සමාජයන්හි විසූවන් විසින් සිය අවශ්‍යතා සඳහා නිපදවා පරිහරණය කොට වර්තමානයට දායාද කොට තිබෙන ද්‍රව්‍යාත්මක දේ තුළින් එකී සමාජ නියෝජනය කළ පිරිස් සතුව පැවති සංස්කෘතික තත්ත්ව පිළිබඳව ද මැනවින් අවබෝධ වෙයි.

එලෙස අතීතයෙන් වර්තමානය කරා පැමිණ ඇති සියල්ල පුරාවිද්‍යාත්මක උරුමය යනුවෙන් හඳුන්වනු ලැබේ. ඒ සඳහා විවිධ අගයන් ද අද වන විට ලැබී ඇත. මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාව ආශ්‍රිතව එවැනි උරුමයන් ප්‍රභවය වීම සඳහා හා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අතීතයේ දී පටන් භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරන ලද මෙහෙය හා අද්‍යතනයේ දී එම උරුමය ආරක්ෂාකර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා විසින් සිදු කළයුතු මැදිහත් වීමේ ප්‍රමාණය පිළිබඳව සාකච්ඡා කෙරේ.



## පුරාවිද්‍යා උරුම ආරක්ෂණ ක්‍රියාවලිය හා එහි හැසිරීම

පුරාවිද්‍යා උරුමය යනුවෙන් ගැනෙන්නේ සෑම රටකම අතීතයේ දී ජීවත් වූ මිනිසුන් විසින් ඔවුන්ගේ කටයුතු නිසියාකාරව සිදු කරගැනීම වෙනුවෙන් නිපදවා පරිහරණය කර වර්තමානිකයා වෙනුවෙන් ශේෂකොට ඇති දේවල් ය. යම් රටක, ජාතියක නිදහස් බව, නිවහල් බව, අතීත ශ්‍රී විභූතිය, වත්මනට සම්ප්‍රේෂණය වන්නේ එවැනි උරුමය මගිනි. යම් යම් රටවල් කේන්ද්‍ර කරගෙන පවත්නා උරුමයන් ඒවායෙහි ස්වභාවය අනුව ස්වාභාවික හා සංස්කෘතික උරුමය යනුවෙන් බෙදා වෙන්කර දක්වනු ලැබේ. මෙයින් ස්වාභාවික උරුමය වන්නේ භෞතික හා ජීව විද්‍යාත්මක ස්වාභාවික භූ නිර්මාණ, භූ විද්‍යාත්මක හා භූ රූපණ නිර්මාණ, සුවිශේෂ සත්ත්ව හා පැළෑටිවලින් සමන්විත ප්‍රදේශ හා ස්වාභාවික ප්‍රදේශ ආදියයි. එමෙන්ම සංස්කෘතික උරුමයන් මානව ක්‍රියාකාරීත්වය නිසා නිර්මාණය වූවක් ලෙස හැඳිනගත හැකිය. එසේම සංස්කෘතික උරුම අස්පර්ශීය හා ස්පර්ශීය යනුවෙන් දෙකොටසක් යටතේ ද දක්වා ඇත. අස්පර්ශීය උරුමය යනු ව්‍යවහාරික, ප්‍රාසාංගික හා ලේඛනගත කලාව ය. ස්පර්ශීය උරුමය චංචල හා නිශ්චල වශයෙන් දෙකොටසකට බෙදෙයි. නිශ්චල උරුමයන් වාස්තු විද්‍යාත්මක නිර්මාණ වන අතර චංචල උරුමය වාස්තුවිද්‍යාත්මක නිර්මාණ සමග බැඳී පවතින කලාත්මක අවශේෂයන් ය. පුරාවිද්‍යාත්මක උරුමය ලෙසින් අර්ථකථනය කරනු ලබන්නේ මෙම ස්පර්ශීය උරුමය ය.[1]

මෙනයින් බැලීමේ දී කිසියම් ජනසමාජයක් තුළ ඇති සංස්කෘතික උරුමය ආරක්ෂා කරගැනීම, මතුකරගැනීම, තහවුරු කිරීම, නැවත ප්‍රයෝජනයට ගැනීමේ හා හැකි උපරිම කාලයක් විනාශ නොවී පවත්වා ගැනීමේ කාර්ය විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව පවත්නා සීමිත සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස හා සඵලදායී ලෙස යොදාගනිමින් කරනුලබන ක්‍රියාවලිය පුරාවිද්‍යා උරුම කළමනාකරණ ක්‍රියාවලිය ලෙස හඳුන්වනු ලබයි.[2]

පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ කේන්ද්‍රය පුරාවස්තු ය. ඒවා ලෝක සංස්කෘතික උරුමයේ ජීවමාන සාධක ලෙස ද හැඳින්විය හැකිය. මෙම උරුමය සඳහා මිනිසා විසින් දක්වන ලද අසීමිත

ලැදියාව හේතුවෙන් මේ දක්වා ලෝකයට අහිමි වූ පුරා සාධකයන්හි ප්‍රමාණය අපමණ ය. පුරාවිද්‍යා විෂය විද්‍යාත්මක විෂයක් ලෙස වර්ධනය වීමෙහි ලා පුරාවස්තු සොරකම හා විනාශය මුඛ්‍ය සාධකය වූ බැව් එහි වර්ධනයේ ඉතිහාසය පිළිබඳව විමැසීමේ දී පැහැදිලිව පෙනී යන්නකි. 14-15 සියවස්වල දී සිදු වූ යුරෝපීය පුනරුදයත් සමග සංස්කෘතික වස්තු කෙරේ මිනිසුන් තුළ විශේෂ ඇල්මක් හටගැනුණි. ඒ නිසාම 16 වන සියවසේ සිට 19 වන සියසේ ආරම්භය දක්වා ම එවකට යුරෝපයේ සිටි ධනවත් හා බලවත් පුද්ගලයින් විසින් මෙම වස්තු රැස්කරලීම සඳහා අවිධිමත් කැණීම් කටයුතු සිදු කෙරුණි.[3] ඒවායින් ලද පුරාවස්තුවලින් යුරෝපීය ඇෂ්මොලියන්, ලූවර්, බ්‍රිතාන්‍ය ලන්ඩන් යනා දී කෞතුකාගාර පිරීයාමෙන් ඒ බැව් පැහැදිලිවේ.[4]

දැඩි තරගකාරී බවකින් සිදු වූ මෙම කටයුතු හේතුවෙන් පුරාවස්තු සඳහා අගයක් ලැබුණු අතර ඒ නිසා ම යුරෝපය කේන්ද්‍ර කරගෙන පුරාවස්තු සම්බන්ධව දැඩි ව්‍යසනයක් සිදු විය. මෙලෙසින් ඇරඹි සංස්කෘතිකමය වටිනාකම් සහිත පුරාවස්තු විනාශය වර්තමානය වන විට විවිධ බලපෑම් හේතුවෙන් මහා පරිමාණයෙන් සිදු වේ. මෙම උරුමයන්හි ඇති වටිනාකම් නිසා ම එම විනාශය උවදුරක් ලෙස දුටු ජාත්‍යන්තර ප්‍රජාව ලොව පුරා පවත්නා මෙවැනි උරුමයන්හි ආරක්ෂාව සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකර ඇත. එනිසා මෙවැනි උරුමයන් ආරක්ෂාකරගනු සඳහා යුනෙස්කෝ, අයිකොමස්, වැනි ජාත්‍යන්තර ආයතන බිහිකරගෙන ඇත.[5] අද්‍යතනය වන විට මෙම ආයතන මගින් පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් නිසි කළමනාකරණ ක්‍රමවේද රැසක් ක්‍රියාවේ යොදවන බැව් ඒවායෙහි ක්‍රියාකාරීත්වය විමැසීමෙන් පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මූල ඉතිහාසය ඔස්සේ ඓතිහාසික යුගය සහ ප්‍රාග් නවීන සමාජය දක්වා වන දීර්ඝ කාල රාමුවට අයත් අංගයන්ගෙන් සමන්විත වන බැව් පැහැදිලිව පෙනී යන්නකි. ඒවායෙහි භාව විෂය, සංස්කෘතික හා පරිහරණ අගයන් ආරක්ෂා කිරීම උරුම කළමනාකරණ විෂයෙන් සිදු කෙරේ.[6]



## ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්හි ප්‍රවර්ධනය හා ආරක්ෂණය සඳහා භික්ෂූන් වහන්සේලාගේ දායකත්වය

මෙරට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කටයුතු 1890 වසරේ දී ඇරඹි නමුදු එම කටයුතු ස්ථාපිත කිරීම සඳහා අඩිතාලම යොදා ඇත්තේ එයට විසි වසරකට පෙරය. එම කටයුතු ආරම්භයේ දී ම දාගැබ් හා වෙනත් නෂ්ටාවශිෂ්ට ගොඩනැගිලි පිළිබඳ විස්තර අඩංගු කොට ජේ.පී ස්මිදර් විසින් "අනුරාධපුරයේ පුරාවිද්‍යාත්මක නටබුන්" නමින් කෘතියක් එළිදක්වා ඇත. මෙම අවධියේ ම දිවයිනේ ප්‍රධාන බෞද්ධ විහාරස්ථානවල සංචාරය කොට එම ස්ථානවල පැවති ඓතිහාසික අගයෙන් යුතු වෙනත් අත්පිටපත් (ශිලා ලිපි හා සම්බන්ධ) පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා මහ මුදලි ඇල්. ද සොයිසාට බලය පවරා දී ඇත. මෙලෙස ලබාගත් තොරතුරු අනුව පුරාවිද්‍යාත්මක වටිනාකමෙන් යුතු වස්තු පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කර ඇත. ඒ අනුසාරයෙන් සීගිරියේ අද්විතීය චිත්‍ර, අනුරපුරයේ ශෛලමය ප්‍රතිමා, අනුරපුරයේ හා පොළොන්නරුවේ අසිරිමත් දාගැබ්, ආදිය හෙළිදරව් කරගැනීමට හැකියාව ලැබී ඇත.[7] මින් පෙනී යන්නේ මෙරට පුරාවිද්‍යාත්මක කටයුතු ඇරඹී ඇත්තේ ද විහාරස්ථානයන් කේන්ද්‍ර කරගෙන එවකට වැඩසිටි භික්ෂූන් වහන්සේලාගේ අනුග්‍රහයෙන් බව යි.

ඉහතින් සඳහන් කරන ලද පෞරාණික හා කලාත්මක සුන්දරත්වයෙන් ද එසේම ඓතිහාසික වැදගත්කමින් හා සංස්කෘතික අගයෙන් ද යුතු පුරාකෘති මෙරට උත්තරීතර අතීතය පිළිබද සත්‍ය හෙළිකර ඇත. මෙමගින් යටත් විජිත පාලකයින් තුළ ප්‍රසංශනීය හැඟුමන් අවදි වූ අතර මෙරට වැසියා තුළ සිය මුතුන් මිත්තන්ගේ නිර්මාණ කුසලතා මහිමය පිළිබඳ විශ්මයාවහ බවක් ඇති විය. මෙලෙස යටත් විජිත පාලකයින් විසින් අරඹන ලද පුරාවිද්‍යා කටයුතු තුළින් මෙරට අතීතයේ ශ්‍රී විභූතිය කියාපානා සාධක විශාල වශයෙන් හෙළි පෙහෙළි වූ අතර මෑත භාගය වන විට මෙම කටයුතුවලින් අනාවරණය වන දෑ සංස්කෘතික අගයක් ද අයත්කරගෙන ඇත.[8] ඒ ඔස්සේ යමින් පුරාවිද්‍යාඥයින් විසින් පුරාණ ගොඩනැගිලි, ස්ථාන, දාගැබ් හා ප්‍රතිමා වැනි විශාල ස්මාරක හා ස්ථාන හෙළි පෙහෙළි කරනු ලබයි. අද්‍යතනය වන විට මේ සියල්ල සම්බන්ධයෙන් විශේෂ

අවධානයක් යෙදිය යුතුව ඇත. ආගමික ස්මාරක සම්බන්ධයෙන් මේ අවධානය විශේෂ ය. ඒ මෙරට සංස්කෘතියෙහි ශීර්ෂය එම ස්ථානයන වන හෙයිනි. එම නිසා පෞරාණික ස්මාරක හා ස්ථාන සංරක්ෂණය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා අළුත්වැඩියා කිරීම අවශ්‍යයෙන් ම කළ යුතුය.

මෙම අදහස පැහැදිලි කරගත හැකි කදිම නිදර්ශනයක් ලෙස ජේම්ස් පර්ගියුසන් විසින් ''ඉන්දීය හා පෙරදිග වාස්තුවිද්‍යාවේ ඉතිහාසය'' නමැති කෘතියේ දක්වා ඇති අදහස දැක්විය හැකිය. ''ග්‍රහයන් ද සිය පිහිටීම මගින් ලංකාවේ පුරාවිද්‍යාවට අපල සිදුකොට ඇත්තේය......එනමුදු අප දන්නා සියලු රටවල් අතුරින් අශෝක සමයේ සිට අද දක්වා අනුක්‍රමයෙන් ව්‍යාප්ත වූ බෞද්ධ ස්මාරක සියල්ල නොඅඩුව දක්නට ඇත්තේ ලංකාවේ පමණකි. මහාවංසය තුළ ලියැවී ඇති පරිදි මුල් කාලීන ගොඩනැගිලි පිහිටවූ දින හා ඒවායේ අරමුණු සෑහෙන පමණ නිවැරදිතාවකින් යුතුව දැනගත හැකි තරම් විස්තර සහිත හා විශ්වාසකටයුතු ඉතිහාසයක් තිබෙන්නේ ද ලංකාවේ පමණකි'' යනු එම අදහසයි.[9]

මින් පෙනී යන්නේ ඉතා වැදගත් ඉතිහාසකරණ සම්ප්‍රදායයක් ශ්‍රී ලංකාව තුළ පැවතීගෙන එන බවයි. ඓතිහාසික වාර්තා හා මූලාශ්‍රය, අභිලේඛන හා වැදගත්කමක් දරන පුරාණ ක්ෂේත්‍ර, ස්මාරක හා මානව කෘති අපගේ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදායයේ අංග ලෙස දීර්ඝ ඓතිහාසික කාල පරිච්ඡේදය මුළුල්ලේ තිබී ඇත.[10]

මෙම සියල්ලෙහි ආරම්භය පිළිබදව විමසා බැලීමේ දී සිංහල සංස්කෘතියෙහි ආරම්භය හා විකාශනය පිළිබඳව ද විමැසිය යුතුය. එහි දී මහින්දාගමනයත්, උන්වහන්සේ විසින් මෙරටට බෞද්ධාගම හඳුන්වා දීමත් අතිශය ප්‍රමුඛ වේ. එම ඓතිහාසික සංසිද්ධිය සිංහල සාහිත්‍ය කෙරෙහි පමණක් නොව එහි සංස්කෘතිය කෙරෙහි ද විශාල වශයෙන් බලපා ඇත.[11] දෙවන පෑතිස් රජ දවස බුදු දහම මෙරටට හඳුන්වා දීම වැදගත් සිදුවීමක් වන්නේ ආසියාවේ ආගමික බලවේගයක් බවට පත් බුදු දහම පදනම් කොටගෙන මෙරටෙහි ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරයක් හා රාජත්වයක් ද බිහිවීමට එයින් පදනම් වැටීම කරණ කොටගෙනය.[12]



මිහිඳු මහ රහතන්වහන්සේගේ වැඩමවීමත් සමගම එතෙක් රජරට සභ්‍යත්වයේ පැවති ගෘහ නිර්මාණ හා වාස්තුවිද්‍යාව ද නව මගක් ගෙන ඇත. ඉන්දියාවේ පැවති කටාරම් කොටා ලෙන් භාවිතයට ගැනීමේ සම්ප්‍රදාය උන්වහන්සේ මෙරටට හඳුන්වා දුන් අතර ක්‍රි:ව 3වන ශතවර්ෂය දක්වා ශත වර්ෂ හයක්ම භික්ෂූන් වහන්සේලා බහුතරයකගේ වාසස්ථාන බවට ඒවා පත්ව පැවත තිබී ඇති බැව් ද පෙනී යයි. එහෙත් අනුක්‍රමයෙන් විහාරවාසික භික්ෂු පිරිසක් ද බිහි වූ අතර ලෝහ ප්‍රාසාදය වැනි විහාරයන් ඉදිවූයේ එබැවිනි. එලෙස ඉදි වූ විහාර සංකීර්ණයන් අපගේ පැරණි ගෘහ නිර්මාණ ශිල්පයෙහි පැවති තාක්ෂණික දියුණුව මැනවින් ප්‍රදර්ශනය කරයි.[13]

මහාවංසයෙහි 14-15-16-17 පරිච්ඡේදයන්හි දැක්වෙන පරිදි මහාමේඝ වනෝද්‍යානය පිළිගැනීමෙන් පසුව මිහිඳු මහ රහතන් වහන්සේ විසින් අනාගතයෙහි බුදු සමයෙහි මධ්‍යස්ථානය වශයෙන් අනුරාධපුර නගරය තුළ සැලසුම් සකස් කළ අතර එහි ඵලයක් ලෙස මහාවිහාරය බිහි විය. ආරම්භයේ දී විවිධ ආගමිකයන් විසූ මධ්‍යස්ථානයක් වූ මෙම නගරය පසුව බෞද්ධාගමික පූජනීය නගරයක් බවට පත් වූයේ මිහිඳු හිමියන්ගේ මූලික සැලසුම් වලින් පසුව ය.[14]

බුදුදහම මෙරට පැතිර යාමත් සමග බෞද්ධ ආගමික අධ්‍යාපනයෙහි අවශ්‍යතාව ද පැනනැගුණි. ඒ නිසා ම ආරාමික අධ්‍යාපන මධ්‍යස්ථාන ආරම්භය විය. ඒවායෙහි අධ්‍යාපනය භාරව සිටියෝ භික්ෂූහු ම ය. ඒ අනුව අධ්‍යාපනයෙහි කේන්ද්‍රය වූයේ පන්සල මුල්කරගත් පිරිවෙන යි. ඒවායෙහි දී ගිහි පැවිදි දෙපක්ෂයම ශාස්ත්‍ර හදාරා තිබේ. ආගමික වූ ද ලෞකික වූ ද අධ්‍යාපනය භික්ෂූන් සතුව පැවතිණි. ඒ නිසා බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාව හා භාරය ද උන්වහන්සේ සතු කාර්යයක් ලෙස සලකන ලදි.[15]

ආරම්භක අවධියේ දී භික්ෂු අධ්‍යාපනය තුළ ග්‍රන්ථ ධූරය යනුවෙන් අදහස් කරනු ලැබුවේ අටුවා සහිත ත්‍රිපිටක ධර්මය ඉගෙනීම හා ඉගැන්වීම පමණ ය. එහෙත් පසුව භාෂා ශාස්ත්‍ර, ඉතිහාසය, කලා ශිල්ප, යනාදිය පමණක් නොව රාජනීතිය හා වාරි කර්මාන්ත ආදියෙහි මෙන්ම වෛද්‍ය ශාස්ත්‍රය ආදියෙහි පුහුණුව ද ඊට ඇතුළත් වූ බව මූලාශ්‍රය පරිශීලනයෙන් පෙනී යයි.[16]

දුටුගැමුණු රාජ්‍ය අවධිය වන විට භික්ෂූන් වහන්සේ ජාතික හා සංස්කෘතික ආදී සෑම අංශයක ම ප්‍රමුඛව ක්‍රියාකළහ. ගෘහ නිර්මාණ ශිල්පය වැනි ශාස්ත්‍ර පිළිබඳව උන්වහන්සේගේ දැනුම ඉතා උසස්ව පැවතී ඇත. ගැමුණු රජුගේ ඉල්ලීම පරිදි නව මහල් ලෝවා මහපායෙහි සැලසුම අඳින ලද්දේ රහතන් වහන්සේ නමක් බව මහාවංසයෙහි දක්වා ඇත. එසේම මහාථූපයෙහි ධාතු ගර්භයේ සැලැස්ම හා සියලුම කර්මාන්ත සංවිධානය ඉන්දගුත්ත මහරහතන් වහන්සේ විසින් සිදු කළ බව ද එහි සඳහන් ය.[17]

චුල්ලවග්ගපාළියේ සඳහන් වන ආකාරයට විහාරාරාම ඉදිකිරීම, රැකබලා ගැනීම, ඒවා ප්‍රතිසංස්කරණය කෙරෙහි මැදිහත්වීමට භික්ෂූන්ට අනුමැතිය ලැබී ඇත. පළමු වන ධර්ම සංගායනාව සිදු කිරීමට පෙර ඒ සඳහා සම්බන්ධ වූ එම තෙරවරුන් විසින් ජරාවාසව පැවති ගොඩනැගිලි නව කම් කිරීම මගින් ඒ බව පැහැදිලි වේ.[18] මින් පැහැදිලි වන්නේ ආගමික වශයෙන් වැදගත්කමක් දරන ඉදිකිරීම් සඳහා මැදිහත් වීමට භික්ෂූන් වහන්සේලාට වගකීමක් පැවති බව ය.

දඹදිවින් මෙරටට ලැබුණු ජය ශ්‍රී මහා බෝධිය, පාත්‍රා ධාතුව, දළදා වහන්සේ, කේශ ධාතු ආදී සියලුම පූජනීය වස්තූන් ද මහාථූපය ආදී ආගමික වැදගත්කම් සහිත ඉදිකිරීම් ද සිංහලයන්ට අයත් ජාතික වස්තු සේ සලකා මෙරට සිටි පාලකයෝ ආරක්ෂාකර කළහ. මෙලෙස ජාතියත් රාජ්‍ය පාලනයත් එක්වීම රටේ පාලන කටයුතුවලට ද ජාතියේ නිදහසට හා ආරක්ෂාවට ද හේතු වූ අතර එහිලා භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධය ද කැපී පෙණුනි.[19]

මෙම සම්ප්‍රදාය කෙතරම් මුල් බැසගත් අදහසක්ව පැවතියේ ද යත් භික්ෂූන් වහන්සේලා අලුත් ගොඩනැගිලි තැනවීමේ කටයුතුවලට හෝ කාලයාගේ ඇවෑමෙන් ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සහභාගී නොවීම යුතුකම් පැහැර හැරීමක් ලෙස සලකා ඇති බව මිහින්තලා පුවරු ලිපිය ආදී මූලාශ්‍රය මගින් හෙළිවෙයි. ඇතැම් විට මෙවැනි කටයුතු පැහැර හැරි විට දී අන් පිරිස්හි දෝෂාරෝපණයන්ට පවා ලක් වීමට සිදුව ඇත. මින් ගම්‍ය වන මුඛ්‍ය කරුණ වන්නේ භික්ෂූන්ගේ කටයුතු අතර උරුමය සුරැකීම සඳහා කටයුතු කිරීම වැදගත් සේ සලකා ඇති බව යි.[20]



මහින්දාගමනයත් සමග මෙරටට උරුම වූ ආගමික සම්ප්‍රදාය කරණ කොටගෙන බිහි වූ උරුමය සමාජ, දේශපාලනික, ආගමික හා ආර්ථික ආදී සෑම ක්ෂේත්‍ර පාදක කොටගෙන වර්ධනය වී ඇත. මෙම කරුණ මැනවින් අවබෝධ කරගත් පැරැන්නන් දිවි හිමියෙන් මෙම උරුමයන් සුරැකීමට කටයුතු කර ඇති බව ද ඉතිහාසය විසින් පහදනු ලබයි. ක්‍රි:පූ: යුගයේ පටන් මෙරට පාලන බලය අත්කරගත් බොහෝ පාලකයින්, සංඝ සමාජය හා සාමාන්‍ය වැසියන් ආදී සියලුම දෙනා විසින් උරුමයේ සත්‍යතාව රැකගනිමින් උරුම කළමනාකරණය කෙරෙහි මැදිහත් වී ඇති බවට සාහිත්‍ය හා සෙල් ලිපි මූලාශ්‍රය සාධක සපයයි.[21]

උරුමය ආරක්ෂා කරගැනීම සඳහා භික්ෂූන් විසින් සිදු කරන ලද මෙහෙය සිංහල රාජ්‍යයේ අවසන් භාගය වූ මහනුවර අවදිය තුළ දී හා ඉන්පසුව ද සිදු කර ඇත. එම අවධියේ දී භික්ෂූන්ගේ මැදිහත් වීම මත විහාරයන්හි සිතුවම් නිමැවූ බැව් සඳහන්ව තිබීමෙන් එ බව තහවුරු වේ. දෙගල්දොරුව හා රිදී විහාරය යන විහාරයන්හි සිතියම් අඳින ලද්දේ එම අවදියේ සිටි ඉතාම දක්ෂ ශිල්පියෙකු වූ දෙවරගම්පළ සිල්වත්තැන නමින් ප්‍රසිද්ධ වූ අයෙකි. මෙම සිතියම් ඇද ඇත්තේ මල්වතු විහාරයේ වැඩසිටි මොරතොට මහා ස්ථවිරයන් වහන්සේගේ අනුදැනුම ඇතිවය. එසේම පැලියගොඩ විද්‍යාලංකාර මහ පිරිවන පිහිටුවා වදාළ රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මහාස්ථවිරයන් විසින් ද සත් කෝරලයේ වැඩ සිටිය දී විහාර කීපයක ජරාවාස හැර චිත්‍ර කර්මාන්තයන් සියතින් ම සිදු කර ඇත.[22]

මහනුවර යුගයෙහි සිටි කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේගේ අවවාද මත පිහිටා අනුරාධපුරයෙහි පූජ්‍යස්ථාන නගා සිටුවීමට කටයුතු සිදුකර ඇත. එම රජු විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේට පැවති තර්ජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ඒ වටා ප්‍රාකාරයක් තැනවීමට කටයුතු යොදා ඇත. මෙම ප්‍රාකාරය ඉදිකිරීම ඉලුපැන්දෙණියේ හිමියන්ගේ අනුශාසකත්වයෙන් යුතුව සිදු කෙරිණි. එම හිමියන් වැලිවිට හිමියන්ගේ දෙවනියා ලෙසින් සිල්වත් සමාගමෙහි වැඩ කළ තෙරුන් වහන්සේ නමකි. මෙම හිමියන් අනුරාධපුරයෙහි වන්දනාවේ ගොස් එහි නැවතී පූජනීය ස්ථානයන්හි ප්‍රතිසංස්කරණ කටයුතු මෙහෙයමින් සිටිය දී ම අපවත් වී ඇත.[23]

මෙලෙසින් මෙරට සංස්කෘතිකමය උරුමයන් ආරක්‍ෂා කර ගැනීම සඳහා භික්‍ෂූන් වහන්සේලා විසින් සිදු කරන ලද මෙහෙයෙහි වඩා මෑත නිදර්ශනයන් යටත් විජිත අවදියේ දී උන්වහන්සේලා කළ කී දෑ ආශ්‍රයෙන් හැඳිනගත හැකිය. 1831 වර්ෂයේ දී අනුරාධපුරයෙහි වැඩ විසූ ඉපලෝගම අනුනායක මා හිමියන් විසින් මහනුවර සංඝ සභා මණ්ඩලය වෙත පුරාවිද්‍යා උරුමය සඳහා සිදුව ඇති විනාශය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර ඇත. නොයෙක් වාස්තු විද්‍යා ඉදිකිරීම හා ස්මාරක ආදිය පොළවට යටවන මට්ටමට එම ස්ථානයන් වල් බිහිව ජරාවාසව ඇති බවත් විශාල වෘක්‍ෂ ගොඩනැගිලි මත ඇද වැටී ඇති බවත් ඒවායේ මුල් හේතුවෙන් උරුමයන් සඳහා විශාල වශයෙන් හානි සිදුව ඇති බවත් එම උරුමයන් ආරක්‍ෂා කිරීමට පියවර ගත යුතු බවත් එම වාර්තාවෙන් දක්වා ඇත.[24]

ඉංග්‍රීසි පාලන සමයේ දී මෙරට පුරාවිද්‍යා වැඩකටයුතු ආරම්භ කළ මුල් දශකයන්හි සිටි යුරෝපීය පුරාවිද්‍යා කොමසාරිස්වරුන් වැඩකටයුතු සිදු කරන ලද්දේ පරාධීන ජාතියක් තුළ ය. එම නිලධාරීන්ට තම හිතු මනාපය පරිදි තමන්ට රිසි ස්ථානයන් වෙත ගොස් සිය අභිමතය අනුව වැඩකටයුතු සිදු කළ හැකි විය. මෙම ක්‍රියාවලිය පිළිබඳව අපැහැදුණු ඇතැම් භික්‍ෂූන් හා ගිහි පිරිස් ඔවුන්ගේ වැඩ කටයුතුවලට බාධා කර ඇත. එම නිසා එම නිලධාරීන්ට මෙම කටයුතුවල දී පරිස්සමින් යුතුව වැඩ කටයුතු කරන්නට සිදුව ඇත.[25]

මෙම අවධියේ දී උරුමයන් ආරක්‍ෂා කරගැනීම සඳහා ඇතැම් තෙරවරුන් ක්‍රියා කළ ආකාරය පිළිබදව අධිරාජ්‍ය විරෝධී සටනේ පෙර ගමන් කරුවෙකු වූ වලිසිංහ හරිස්චන්ද්‍ර විසින් මැනවින් සටහන් කොට ඇත. එතුමන් දක්වන පරිදි 1873 වසරේ දී නාරංවිට සුමනසාර හිමිපාණන් විසින් මහාථූපය ප්‍රතිසංස්කරණය කරන්නට පටන්ගෙන ඇත. උන්වහන්සේ මෙම කටයුත්ත සිදු කිරීමේ දී නවාතැනක්වත් නොලැබ සෑ මළුවෙහි බර කරත්ත අඹරාවක සෙවණ නවාතැන බවට පත් කරගනිමින් ඉතා දුක සේ සිදු කොට ඇත. මෙම හිමියන් විසින් සෑයට නැගෙනහිර දිශාවෙන් පිහිටි විහාර ගෙය ද චෛත්‍ය හා සම්බන්ධ තවත් සෙසු ගොඩනැගිලි කීපයක් ද තනවා ඇත. එවකට මෙරට ආණ්ඩුකාර ධුරය හෙබවූ විලියම් ග්‍රෙගරි මහතා ද මෙම හිමියන්ගේ උත්සාහය ගැන පැහැදී අනුග්‍රහ දක්වා ඇත.



එහි දී ආණ්ඩුකාරවරයා විසින් මේ සඳහා ආධාර කොට ඇත්තේ මෙය ආගමික ගොඩනැගිල්ලක් සේ සලකා නොව සිංහල ජාතිය සිහිගැන්වීමට හේතු වන අනගි ගොඩනැගිල්ලක් සේ සලකාගෙන ය. උන්වහන්සේ විසින් මෙම කර්මාන්තය සිදු කිරීමෙ දී 1902 දී "අනුරාධපුර රුවන්වැලි මහා චෛත්‍ය වර්ධන සමාගම" යනුවෙන් සමිතියක් පිහිටුවාගෙන මෙම කටයුතු සඳහා අන්‍යයනගේ සහාය ද ලබා ගැනීමට කටයුතු යොදා ඇත.[26]

එමෙන්ම මෙවැනි මැදිහත්වීම් පිළිබද තතු පැහැදිලිවන වෙනත් තොරතුරු ද වලිසිංහ හරිස්චන්ද්‍ර විසින් වාර්තා කර ඇත. එතුමන් විසින් යුද හමුදා නිලධාරිවරයෙකු වශයෙන් මෙරට සිටි ෆෝබ්ස් උපුටා දක්වමින් 1828-1829 යන වර්ෂවල දී එක්තරා භික්‍ෂූන් වහන්සේ නමක විසින් අභයගිරි දාගැබ මත්තෙහි හා මළුවෙහි වැවී පැවති කැලෑව කපා එම ස්ථානය එළිපෙහෙලි කළ බව දක්වා ඇත. එසේම එවකට උතුරුමැද පළාතේ ප්‍රධාන සංඝ නායක මා හිමියන් වශයෙන් කටයුතු කළ මේධංකර හිමියන් විසින් බෞද්ධ අයිතීන් කහවුරු කිරීම සඳහා ඉංග්‍රීසි නායකයින්ට යොමු කළ ලිපි පිළිබද විස්තර ද දක්වා ඇත.[27]

මෙයට අමතරව මෙතුමන් විසින් අයිවර්ස් ඒජන්තවරයා උපුටා දක්වමින් ඉදිරිපත් කරන තොරතුරු අනුව පුරාණ රාජධානි සමයට අයත් ශෛලමය නටඹුන් අතරෙහි 1833 වසරේ දී ආණ්ඩුවේ නිලධාරියෙක් පදිංචි කර ඒ තුළ මිනිසුන් පදිංචි කරවීමට අඩිතාලම දමා ඇත. මෙම සිදුවීම සිදුවන වන මොහොත වනවිට ද බෝ මළුව අසල භික්‍ෂූන් වහන්සේලා කීප නමක් පදිංචිව සිට ඇත.[28] මින් පැහැදිලි වන කරුණ වන්නේ මෙම භූමිය ජනාවාසයෙන් තොරව පැවතියේ වුව ද අතීතයේ පටන්ම ජාතික උරුමයක් වශයෙන් සලකන ලද ශ්‍රී මහා බෝධීන් වහන්සේ කුමන අපහසුකම් පැවතිය ද ආරක්‍ෂා කරගැනීම සඳහා භික්‍ෂූන් වහන්සේලා විසින් කටයුතු සිදු කර ඇති බව ය.[29]

මෙරට පුරාවිද්‍යා කටයුතු නිල වශයෙන් ආරම්භ වීමෙන් පසුව ඒ පිළිබඳව කටයුතු කළ නිලධාරීන්ට සිය අභිමතය පරිදි සියලු දේ තීරණය කොට කටයුතු කිරීමට භික්‍ෂූන් වහන්සේලා වෙතින් අනුග්‍රහය සැලසී නැති බව එම කාලයට අයත් පුරාවිද්‍යා පාලන වාර්තාවන්හි සඳහන්ව ඇත. ඒ බැව් ආචාර්ය සී. ගොඩකුඹුර උපුටා දක්වමින්

ඩබ්ලිව්.එච්. විජේපාල විසින් සිදු කර ඇති සටහනකින් මැනවින් විශද වේ. එහි දී ඔහු දක්වා ඇත්තේ පුරාවිද්‍යා ස්ථාන පිළිසකර කිරීම ඇතුළු වැඩ කටයුතුවල දී ඒවායේ විද්‍යාත්මක අංශය සේම බැතිමතුන්ගේ සිතැඟියාවන් ද පරිපූරණය වන ලෙස ඒවා සිදු කළ යුතු වූ බවයි. එම කටයුතු එනයින් කළ යුතු වන්නේ මෙරට පෞරාණික ස්ථානයන්ගෙන් බොහොමයක් රට වැසියාගෙන් වැඩි කොටසකගේ ආගම හා බැඳී පවත්නා හෙයිනි. ඒ එසේ වුව ද ආගමේ හා විද්‍යාවේ අවශ්‍යතාවන් එකිනෙක ගැටෙන අවස්ථාවන් ඇති බව ද ඔහු දක්වා ඇත.[30]

මෙම කාලපරිච්ඡේදයේ දී මෙම දෙපක්ෂය අතර බොහෝ සෙයින් අර්බුද හටගෙන ඇති අතර භික්ෂූන් වහන්සේලා ඒ සඳහා විශාල වශයෙන් මැදිහත් වී ඇත. ඉන් එක් අර්බුදයක් වන්නේ 1928-29 වන විට පැනනැගි අනුරපුර රක්ෂිත භූමිය පූජා භූමියක් ලෙස නම් කිරීමේ අර්බුදය යි. එසේම මෙම අවධියේ දී අටමස්ථාන කමිටුව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර ද විශාල වශයෙන් අර්බුද හටගෙන ඇත. මෙම කොමිටිය සඳහා නායකත්වය ගෙන ඇත්තේ ද තෙරවරුන් වහන්සේලා ය. 1910 වසරේ දී එවකට අටමස්ථානාධිපතීන් වහන්සේ වශයෙන් වැඩ සිටි පල්ලේගම රතනපාල හිමියන් විසින් රචිත "සිරි අනුරපුර පුවත" නමැති කෘතියෙහි මෙම කමිටුවෙහි කාර්යභාරය පිළිබඳව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග පැවතිය යුතු සම්බන්ධය පිළිබඳව ද මැනවින් සටහන් කොට තිබේ.[31]

එසේ වුව ද උරුමයන්ට වන හානිය මගහරවා ගැනීම සඳහා පුරාවිද්‍යා නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ද මෙම සමයේ දී සිදුව තිබේ. සාමාන්‍ය ජනතාවට හුරු පුරුදු වී ඇති තෙල් මල් පිදීම වැනි ඇතැම් සිරිත් විරිත් නිසා නටඹුන් ස්මාරකවලට සිදු වන හානිය ගැන පුරාවිද්‍යා නිලධාරීන් විසින් සිදු කළ පහදාදීම්වල දී ඔවුන් සමග එකතුව ස්මාරක ආරක්ෂාකර ගැනීමට කටයුතු කර ඇත. මෙම ක්‍රියාවලියේ දී එක් භික්ෂූන් වහන්සේ නමක් පොළොන්නරුව මාතෘකා කරගෙන දේශනයක් ද සිදු කර ඇත. මෙහි දී උගත් බෞද්ධ සමාජය වගකීමෙන් ක්‍රියා කර ඇති බව ඉන් පැහැදිලි වේ.[32]

එමෙන්ම මෙම කාලයේ දී බෙල් මහතාගේ කැණීම් කටයුතු සම්බන්ධයෙන් මිහින්තලේ බෞද්ධ සමාගමේ අප්‍රසාදය පළ වී ඇති



අතර 1909 දී මෙම සමාගම හා රජය අතර මිහින්තලා විහාරයේ අයිතිය සම්බන්ධයෙන් ආරවුලක් හටගෙන ඇත. එවකට මෙම විහාරයෙහි අධිපතීන් වහන්සේ වශයෙන් කටයුතු කළ කුඹුක්වැවේ රේවත හිමියන් හා වීරපොකුණේ ගුණරතන හිමියන් වලිසිංහ හරිස්චන්ද්‍රතුමාගේ සහය ඇතිව මේ සම්බන්ධයෙන් විශාල අරගලයක් ගෙන ගොස් ඇති අතර 1910 දී කොළඹ විද්‍යෝදය පිරිවෙනේ දී හික්කඩුවේ සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් යුතුව රැස්වීමක් පවත්වා මේ සම්බන්ධයෙන් අයිතිය විහාරය සතු බව පවසමින් ආණ්ඩුකාර වරයා වෙත සංදේශයක් භාර දී ඇත. මෙම අර්බුදයේ දී ආණ්ඩුකාරවරයා ද මිහින්තලයට පැමිණ භික්ෂූන් වහන්සේලා තම පක්ෂයට හරවා ගැනීමට උත්සහ කළ ද භික්ෂූන් ඒ සඳහා අවනත කර ගැනීමට ඔහුට නොහැකි වී ඇත. මෙහි දී මේ සඳහා මැදිහත් වූ පිරිස මල්වතු විහාරයෙහි මහානායක තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමියන්ගේ මූලිකත්වයෙන් එංගලන්තයේ යටත් විජිතභාර මහලේකම් වෙත පැමිණිලි කොට විහාරය සඳහා සෑහෙන තරම් දේපළක් හිමි කරගෙන ඇත.[33] මින් පෙනී යන්නේ ලාභ ප්‍රයෝජන හමුවේ භික්ෂූන් සිය ජාතික උරුමයන් පාවා නොදී ආරක්ෂාකරගත් බවය.

මෙරට අතීත උරුමයන්හි ඉතිහාසය පිළිබඳව උගත හැකි හොඳම මූලාශ්‍රය වන මහාවංසය ජාතික උරුමයකි. මෙම උරුමය වත්මනට දායාද කිරීම සඳහා හික්කඩුවේ සුමංගල හිමියන් හා බටුවන්තුඩාවේ පඬිතුමා විශාල මෙහෙයක් සිදු කර ඇත. එම දෙදෙනාගේ මහාවංස සංස්කරණයේ දී හා සිංහල අනුවාදය ලිවීමේ දී ඒ සඳහා දරා ඇති පරිශ්‍රමය මගින් ඒ බව පැහැදිලි වේ. එහි 37වන පරිච්ඡේදයේ සිට එනම් ටීකාවක් නොමැති කොටසේ සිට 101වන පරිච්ඡේදයේ 29වන ගාථාව දක්වා වන කොටසට ලියා ඇති සංඥාපනයෙන් ඒ බව පෙනී යයි.[34]

19වන සියවසේ දී ඇති වූ බෞද්ධ ප්‍රබෝධය හේතුකොටගෙන අනුරාධපුර නගරයේ පමණක් නොව ගම්බද ප්‍රදේශවල ද නටඹුන්ව අතහැර දමා පැවති වෙහෙර විහාරයන්හි නැවත පන්සල් පිහිටුවා ඇත. එහි ලා මූලිකත්වය ගෙන ඇත්තේ ද හත් කෝරළ ප්‍රදේශයෙන් වැඩමවන ලද භික්ෂූන් වහන්සේලා ය. එමෙන්ම 1828 දී

අටමස්ථානාධිපති ධුරය දරූ ඉපලෝගම අනුනාහිමියන් ථූපාරාමය පිළිසකර කිරීමට කටයුතු කර ඇති අතර 1841 දී එක්තරා හිමි නමක විසින් මුදල් සම්මාදම් කොට මෙම ස්ථූපය අලුත්වැඩියා කළ බව ද සඳහන් වේ.[35]

එසේම මෑත ඉතිහාසයෙහි අධ්‍යාපන ආයතන හා පුරාවිද්‍යාත්මක උරුමයන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ස්ථාපිතකොට ඇති ආයතන හා සම්බන්ධ වී උරුමයෙහි සුරක්ෂිත බව ඇති කරලීම වෙනුවෙන් ක්‍රියාකාරීව කටයුතු සිදු කළ හා සිදුකරමින් සිටින භික්ෂූන් වහන්සේ යම් ප්‍රමාණයක් ද වෙසෙති. විශේෂයෙන් විශ්වවිද්‍යාලයන්හි පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ විෂයයන් උගන්වමින් උරුම සංරක්ෂණයට අදාළ ඥාන සම්පාදනයේ නිරතව සිටින භික්ෂූන් වහන්සේ හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල වැනි ආයතනයන්හි සේවයෙහි යෙදෙමින් උරුම සංරක්ෂණය සඳහා සිය දායකත්වය ලබාදෙන භික්ෂූන් වහන්සේ යම් ප්‍රමාණයක් ද වැඩවෙසෙති.

මෙවැනි කටයුතුවලින් පෙන්නුම් කෙරෙන්නේ මෙරට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා ලංකා ඉතිහාසයෙහි ආරම්භයේ පටන් වර්තමානය දක්වා ම භික්ෂුව සක්‍රියව දායක වී ඇති බවයි.

## නිගමනය

ඉහතින් දක්වන ලද කරුණු අනුව පැහැදිලි වන කරුණක් වන්නේ ලංකාවට බුදු දහම ලැබුණු තැන් පටන් මේ දක්වා ම මෙරටෙහි සංස්කෘතියේ හා උරුමයන්හි ආරක්ෂාව හා අභිවෘද්ධිය භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් ම සිදුව ඇති බව ය. ජාතිය හා ආගම විපතට පත් සෑම මොහොතක දී ම භික්ෂූන් පෙරමුණට පැමිණ ඒවා ආරක්ෂා කරගෙන ඇත.[36] අද්‍යතන භික්ෂූන් වහන්සේලාගේ කාර්ය විය යුත්තේ ද අතීත භික්ෂු සමාජය ආදර්ශයට ගෙන ජාතික උරුමයන් සුරැකීමට පෙරමුණ ගැනීම ය.

අනුරාධපුර අවධියේ දී බුදුදහමේ උන්නතිය වෙනුවෙන් සටන් වදින කුමාරයෙකු ලෙස ගැමුණු කුමරුගේ පක්ෂයට පිරිස් එකතු කිරීමේ දී භික්ෂූන් විසින් සිදු කළ මෙහෙයට කෘතඥතාව පළ කිරීමක් වශයෙන්



එම රජු විසින් වෙහෙර විහාර ගොඩ නගමින් ද සිව්පසය මනා සේ සපයමින් ද කටයුතු කළේ වුව ද රජු වෙනුවෙන් තමන් කළ සේවය වෙනුවෙන් කිසි ලෙසකින්වත් පෞද්ගලික ලාභ ප්‍රයෝජනයන් භික්ෂූන් වහන්සේලා ඉල්ලා නැත. මින් පෙනී යන්නේ සිය ලාභය වෙනුවෙන් නොව ශාසනයේ උන්නතිය වෙනුවෙන් ම භික්ෂූන් වහන්සේලා කටයුතු කොට ඇති බව ය. මෙය අදටත් අතීතයෙන් උගත හැකි කදිම පාඩමකි.

වළගම්බා රාජ්‍ය සමයේ දී හටගත් බැමිණිටියා සාගතය හේතුවෙන් එතෙක් මුඛ පරම්පරාගතව පවත්වාගෙන පැමිණි ත්‍රිපිටකය භික්ෂූන් විසින් ග්‍රන්ථාරූඪ කරන ලද්දේ ද ඒවා විනාශ වීමෙන් වළක්වා ගැනීම සඳහාය. මෙලෙස ග්‍රන්ථාරූඪ කරන ලද ධර්මය ඇතුළත් පුස්කොළ පොත් අදට ද බොහෝ සෙයින් වෙහෙර විහාරයන් සතුව පවතී. මෙවා අපේ උරුමයන් වන නිසා එම විහාරයන්හි වැඩ වසන තෙරවරුන්ගේ කාර්ය විය යුතු වන්නේ එම උරුමයන් සුරැකීමට කටයුතු කොට ඒවා අනාගත පරපුර වෙනුවෙන් ඉතිරි කිරීමට දායක වීම ය.

එමෙන්ම මෙම උරුමයන් සුරැකීමෙහි නිත්‍යානුකූල ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වගකීම හා යුතුකම වන්නේ ද උරුමයන් සුරැකීමේ කාර්යෙහි දී අනාදිමත් කාලයක සිට පරපුරින් පරපුරට මෙම උරුමයන් මැනවින් ආරක්ෂා කරගෙන පැමිණි භික්ෂූන් වහන්සේලා හා සහයෝගයෙන් කටයුතු කිරීම ය.

## ආන්තික සටහන්

01. මණ්ඩාවල පී.බී, (2009), අගයන් මත පදනම් වූ සංස්කෘතික උරුම කළමනාකරණය. චරණ ශාස්ත්‍රීය සංග්‍රහය- දෙවන කලාපය, භික්ෂු සංගමය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පි: 380-381.

02. එම, පි: 381.

03. විජේසේකර, නන්දදේව, (1990), සංඥාපනය, පුරාවි¡ා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය I වෙළුම.

04. රාජපක්ෂ, අරුණ, (2000), නූතන උරුම කළමනාකරණ සංකල්ප සහ අනුරාධපුර ලෝක උරුම නගරයේ උරුම කළමනාකරණ ක්‍රියාවලිය, වැලිපිල පුරාවිද්‍යා

සඟරාව - පස් වෙනි කලාපය, ඒකාබද්ධ උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල, පි: 56.

05. එම, පි:56.

06. ගුණවර්ධන, ප්‍රශාන්ත, (2005), හැඳින්වීම, පුරාවිද්‍යා උරුමය ආකෘති. සංකල්ප සහ කළමනාකරණය, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල.

07. විජේසේකර, නන්දදේව, එම.

08. එම.

09. කරුණාරත්න, ඩබ්ලිව්.ඇස්, (1990), ශ්‍රී ලංකා පුරාවිද්‍යාවේ ඉතිහාසය 1890-1910, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය I වෙළුම, පි: 3.

10. බණ්ඩාරනායක, සේනක, (2000), සංඥාපනය, අනුවාදක - සෝමදේව,රාජ්, පුරාවිද්‍යාවේ සිද්ධාන්ත, ක්‍රම සහ භාවිතය, කර්තෘ ප්‍රකාශන.

11. මල්ලවාරච්චි, උදය, (1993), මිහිඳු සංස්කෘතිය හා මිහින්තලේ, සදීප ප්‍රකාශකයෝ, කොළඹ, පි:17.

12. සෙනවිරත්න, අනුරාධ, (2002), පුරාණ අනුරාධපුරය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි: 4-5.

13. සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (2004), ශ්‍රී ලංකේය ඉතිහාස තරංග, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල, පි: 22.

14. සෙනවිරත්න, අනුරාධ, එම, පි: 14.

15. මල්ලවාරච්චි, උදය, එම, පි: 36-6-37.

16. එම, පි: 41, 17.

17. රාහුල හිමි, වල්පොල, (2012), භික්ෂුවගේ උරුමය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි: 22.

18. ගුණවර්ධන, එම.

19. රාහුල හිමි, එම, පි: 17.

20. ගුණවර්ධන, එම, පි: 16.

21. එම, හැඳින්වීම.

22. රාහුල හිමි, එම, පි: 45-48.

23. කරුණානන්ද, උක්කුබංඩා, (2007), අනුරාධපුර අටමස්ථානය, උරුමය අධ්‍යයන ආයතනය, පොල්ගස්ඕවිට, පි: 28..



24. ගුණවර්ධන, එම, පි: 67.

25. හරිස්චන්ද්‍ර, වලිසිංහ, (2001), සිතියම් සහිත පුරාවිද්‍යාව, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පි: 155-156.

26. එම, පි: 294,327-328.

27. එම, පි.259.

28. කරුණානන්ද, එම, පි: 8-9.

29. විජේපාල, ඩබ්.එච්, (1990), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය 1950-1970, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය I වෙළුම, පි: 133.

30. හෙට්ටිආරච්චි, ඇස්.බී, (1990), පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම, එළිපෙහෙළි කිරීම, නඩත්තු කිරීම හා පරිසරය සැකසීම 1930-1950, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය I වෙළුම, පි: 47.

31. එම, පි: 51.

32. එම, පි: 59.

33. ඉලංගසිංහ, මංගල, (2003), මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය, කර්තෘ ප්‍රකාශන, පි: 78.

34. කරුණානන්ද, එම, පි: 8-9-22.

35. රාහුල හිමි, එම, පි: 66.

36. එම, පි: 25.